**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය -2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විවෘත විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි 02 කට තෙකලා විදුලි සම්බන්ධතාවය ලබාගැනිම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණු රු.4,098,592 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 22 ඡේදය ප්‍රකාරව ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කිරීමකින් තොරව වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම හා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විදුලිබල මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලද විදුලි රැහැන් පද්ධතිය විශ්වවිද්‍යාලයේ වත්කමක් නොවන අතර එය විදුලිබල මණ්ඩලය සතු වත්කමකිඑම නිසා විදුලි රැහැන් . පද්ධතිය වෙනුවෙන් ගෙවන ලද සේවා ගාස්තුව පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇති බව . | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | වාරික වශයෙන් ලැබෙන පාඨමාලා ආදායම වර්ෂයට අදාළව හඳුනාගැනීමේ පදනම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 10 හි 39 ඡේදය ප්‍රකාරව අනාවරණය කර නොතිබීම හේතුවෙන් 2022 සැප්තැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළව පාඨමාලා 18ක් සඳහා ලියාපදංචි වූ සිසුන්ගෙන් ලැබුණු ආදායමෙන් රු.70,057,777 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙසත් රු 165,437,666.ක් කලින් ලද ආදායමක් ලෙසත් ගිණුම්ගත කර තිබුණද එහි නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. | විශ්වවිද්‍යාලය විසින් ලියාපදිංචි ශිෂ්‍යයන්ගෙන් වාර්ෂිකව ශිෂ්‍ය ගාස්තු අය කරන අතර, එය වාරික 02ක් යටතේ ශිෂ්‍යයන්ගෙන් අයකර ගනු ලබයි. අධ්‍යයන වර්ෂය හා ගිණුම් වර්ෂය අතර වෙනසක් පවතින බැවින් සමාලෝචිත ගිණුම් වර්ෂයට අදාල ආදායම එම වසරේ ශිෂ්‍ය ආදායම ලෙස හඳුනාගන්නා අතර ඉතිරිය කලින් ලද ආදායමක් ලෙස ගිණුම්ගත කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ට අනුව හිමිකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී 2021 දෙසැම්බර් 31 දිනට පැවති වැයකළ ප්‍රාග්ධන ප්‍රදාන රු 392,547,770.ක ශේෂය ද වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන රු 24,789,318.ක ශේෂය හා පරිත්‍යාග හා අනෙකුත් ප්‍රදාන රු 623,653,404.ක ශේෂවල එකතුව රු.1,040,990,492 ක් මූලධන සමුච්චිත අරමුදලටද පොදු සංචිතයෙන් මූලධන සමුච්චිත අරමුදලට රු 262,678,203.ක් හා පුනාරවර්තන සමුච්චිත අරමුදලට රු 267,960,710.ක් මාරු කිරීමේදී ජ'ර්නල් සටහන් හා ලෙජර සඳහා සටහන් යොදා නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන 08 ක හා නාවල ප්‍රධාන පුස්තකාලයේ 2022 දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය ශුනය වී තිබුණු රු.208,381,961 ක් හා ශුද්ධ අගය රු.44,264,590 ක් වූ පුස්තකාල පොත් හා සඟරා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 42 හා 43 ඡේදවලට අනුකූල නොවන ආකාරයට 2022 දෙසැම්බර් 31 දිනට රු.325,093,568 ක අගයකට ප්‍රත්‍යාගණනය කර ප්‍රත්‍යාගණන අතිරික්තය ලෙස රු.280,829,078 ක් ගිණුම්ගත කර තිබුණි . | විශ්වවිද්‍යාලය සෑම වර්ෂ 05කට වරක්ම පුස්තකාල පොත් තොග සමීක්ෂණ සිදුකිරීමට කටයුතු කරන අතර ඒ අනුව, ගිණුම්වලට අදාල ගැලපීම් සිදුකරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි 42 හා 43 ඡේද ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී උසස් අධ්‍යාපන ප්‍රවේශ වැඩිකිරීමේ ව්‍යාපෘතියෙන් (AHEAD) ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් සඳහා සහ ස්ථාවර වත්කම් මිලදීගැනීම වෙනුවෙන් ලැබී තිබූ එකතුව රු.18,119,516 ක් සහ පුනරාවර්තන වියදම් වෙනුවෙන් ලැබී තිබූ එකතුව රු.137,265,314 ක් ගිණුම් වලින් අත්හැරී තිබුණි. | පසුගිය වසර ගණනාවක් පුරාවටම ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගතකල ආකාරයටම මෙම වසරේද ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇති බව. | ව්‍යාපෘතියෙන් ලැබුණු වත්කම් හා අදාල වියදම් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ශිෂ්‍ය ආදායම නිවැරදිව හඳුනාගැනීමකින් තොරව ශිෂ්‍ය ආදායම් පාලන ගිණුමේ ශේෂය හා හඳුනානොගත් ශිෂ්‍ය ආදායම් ගිණුමේ ශේෂය අතර රු.760,779,170 ක වෙනස ලැබිය යුතු ශිෂ්‍ය ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එහි කාල විශ්ලේෂණයක්ද ඉදිරිපත් කර නොතිබුණි. | OMIS පරිගණක පද්ධතියේ පවතින අපහසුතා හේතුවෙන් ශිෂ්‍ය ආදායමට අදාළව නිවැරදි කාල විශ්ලේෂණයක් ලබාගැනීමට නොහැකි වී ඇත. නව පරිගණක පද්ධතිය මගින් එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට ඉදිරියේදී බලාපොරොත්තු වන බව. | ශිෂ්‍ය ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී රු.22,972,539 ක් වූ වැඩිපුර ක්ෂය ගිණුම්ගත කිරීම සංශෝධිත මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමේදී දෝෂ සහගත ලෙස ජර්නල් සටහන් යෙදීම හේතුවෙන් ක්ෂය හා ක්ෂය වෙන්කිරීමේ ලෙජර් ගිණුම්වල ශේෂය රු.45,914,112 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ක්ෂය ගණනය කිරීම් ඇස්තමේන්තුවල වරදක් සිදුවී ඇති බව පිළිගන්නා බව. | ක්ෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ගෙවීම් වවුචර, ලදුපත් හා ජර්නල් වවුචරය වැනි මූලාශ්‍ර ලේඛන පිළියෙල කිරීමකින් තොරව, ක්ෂය, ක්ෂය වෙන්කිරීම් හා වත්කම් ගිණුම්වලට පරිගණක ගිණුම් පද්ධතිය තුළින් සටහන් යෙදීම සිදු වී තිබුණි. එවැනි සටහන් තුළින් යොදන ලද වැරදි සටහන් නිවැරදි කිරීම සඳහා වර්ෂය අවසානයේදී ජර්නල් සටහන් යොදා ක්ෂය හා ක්ෂය වෙන් කිරීමේ ගිණුම්වලින් රු.277,275,406 ක් ඉවත් කර තිබුණි. | OMIS පද්ධතියේ වත්කම් ලේඛනය වර්ෂ කිහිපයක් නිවැරදිව යාවත්කාලීන නොවූ බව නිරීක්ෂණය වූ අතර, එම පද්ධතිය තුල පවතින සීමාවන් හේතුවෙන් එය පසුව නිවැරදි කිරීමටද නොහැකි විය. එමනිසා පරිගණක පද්ධතිය මගින් ක්ෂය ගණනය කිරීම් නිවැරදිව සිදුනොවේ. ඒ අනුව පරිගණක පද්ධතිය මගින් ලබාදෙන ක්ෂය ගණනය කිරීම් ජර්නල් සටහන් මගින් ඉවත්කර නිවැරදිව ගණනය කරන ලද වාර්ෂික ක්ෂය අගය ජර්නල් සටහන් මගින් පරිගණක පද්ධතියට ඇතුළත් කරන බව. | පරිගණක ගිණුම් පද්ධතිය නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.5,408,784 ක් වූ අස්පෘශ්‍ය වත්කම් ඒවා මිලදී ගත් දිනයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්‍රමක්ෂය කර නොතිබුණි. | රු 5,340,344.ක් වූ E-books හා මෘදුකාංග) Software) හි ජීවිත කාලය පුරෝකථනය කළ නොහැකි බැවින් එම වත්කම් අවිනිශ්චිත ජීවිත කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් ලෙස හෙළිදරව් කිරීමට කටයුතු කර ඇති බව. | අස්පෘශ්‍ය වත්කම් වල ජීව කාලය හඳුනාගෙන ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන අනුව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයට ගෙවිය යුතු ශේෂ එකතුව රු.2,021,113 ක් දක්වා තිබුණද එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂ රු.4,013,523 ක් වූයෙන් රු.1,992,410 ක වෙනසක් පැවතුණි. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත නිකුත් කළ මුද්‍රණ ඇනවුම් පදනම්ව, ගෙවිය යුතු ශේෂය ගිණුම්ගත කර ඇත. එසේම, Zoom Business Accounts 05 ක් වෙනුවෙන් දරන ලද 2022ගිණුම් වර්ෂයට අදාළ කොටස වන රු 33,002. ක වියදම ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයට ගෙවිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇති බව. | බාහිර ආයතන මගින් ලබාගත් ශේෂ සනාථන හා අභ්‍යන්තර ලියකියවිලි සසඳා නිවැරදි වටිනාකම් පමණක් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2022 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාදේශීය මධ්‍යස්ථාන 25 ක හා ඇඳීම් උපකරණ ඒකකයේ ඇතුළත් පිරිවැය රු.47,666,626 ක් වූ පාඨමාලා ද්‍රව්‍ය තොගය, භෞතිකව පරීක්ෂා කර නොතිබීම හේතුවෙන් එම තොගයෙහි පැවැත්ම හා වටිනාකම්වල නිවැරදිතාවය තහවුරු කරගැනීමට නොහැකි විය. | විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානවල පාඨමාලා ද්‍රව්‍ය ප්‍රාදේශීය මධ්‍යස්ථානවල සහකාර අධ්‍යක්ෂකවරුන්ගෙන් සැඳුම් ලත් කමිටු මඟින් භෞතිකව පරීක්ෂා කර බලා තොග ගණනය කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව පාඨමාලා නොතිබුණු භෞතිකව පරීක්ෂාකර බව පිළිගත නොහැකි බව | විශ්වවිද්‍යාලයේ සියළුම ඒකක හා මධ්‍යස්ථානවල තොග සත්‍යාපනය කර ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.30,282,945 ක් වූ උපචිත වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම්වලින් අඩුකර දැක්වීම හේතුවෙන් වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි | 2021වසරට අදාළව උපචිත වියදම් වෙනුවෙන් ගෙවීම් සිදුකිරීමේදී එම වියදම උපචිත වියදම් ගිණුමට හර කිරීම වෙනුවට අදාළ වියදම් ගිණුමට හර කර තිබීම නිවැරදි කිරීමට 2022 වර්ෂයේ අදාළ වියදම් ගිණුමෙන් අඩු කිරීමට කටයුතු කර ඇත ඒ අනුව . අඩුවෙන් සමාලෝචිත වසරේ වියදම පිළිගත වාර්තා කර ඇත යන්න නොහැකි බව. | උපචිත වියදම් සඳහා ගෙවීම් කිරීමේදී අදාල උපචිත වියදම් ගිණුමෙන් අඩුකිරීම සිදුකළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 102, 103, 104, හා 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා එකතුව රු.31,072,291 ක් වූ හානි වූ හා යල් පැනගිය අධ්‍යයන ද්‍රව්‍ය (Course materials) භාණ්ඩාගාර අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය විසින් කපාහැරීමට අනුමැතිය ලබාදී තිබුණි. | අධ්‍යයන වර්ෂ අතර තුර සිසුන් විසින් පාඨමාලා හැරයාම , විෂය නිර්දේශයන් වෙනස්වීම් ආදී කරුණු හේතුවෙන් ඇතැම් විට මුද්‍රණය කරන ලද පොත්පත් ඉවත් කිරීමට සිදුවේ. මෙය මාර්ගගත අධ්‍යාපනය ලබාදෙන විශ්වවිද්‍යාලයක් තුල සිදුවිය හැකි පොදු තත්ත්වයකි. ඒ අනුව පාලක සභා අනුමැතිය මත එම පාඨමාලා ද්‍රව්‍ය අදාළ වසරේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල්රෙගුලාසි 113(3)(ආ) | ආයතනයේ ප්‍රතිපත්තිය අනුව ලියාපදිංචිය අළුත් නොකරන වර්ෂ 05 ඉක්ම වූ ශිෂ්‍යයන්ගෙන් ලැබිය යුතු රු.10,516,756 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී කපා හැර තිබුණු අතර 2014 වර්ෂයේ සිට 2021 දක්වා එසේ කපාහැර තිබුණු ශිෂ්‍ය ආදායම රු.392,551,000 ක් විය. | විශ්වවිද්‍යාලයේ කිනම් හෝ පාඨමාලාවක් සඳහා ලියාපදිංචියක් ලබාගත් සියළුම සිසුන්ගේ දත්ත විශ්වවිද්‍යාලයේ පරිගණක පද්ධතිය මගින් පවත්වාගෙන යනු ලබයි .යම් ශිෂ්‍යයෙක් පාඨමාලාවෙන් ඉවත් වීම / හැරයාම /අවසන් කිරීම යන කිනම් අවස්ථාවකදි වුවත් එම ශිෂ්‍යයාගේ තොරතුරු පරිගණක පද්ධතියෙන් ඉවත් කිරීමක් සිදු නොකරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11(අ) වගන්තිය | අදාල අමාත්‍යවරයාගේ හා මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් 2022 දෙසැම්බර් 31 දින වන විට රු.1,516,407,982 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | භාණ්ඩාගාර අනුමැතිය ලැබෙන තුරු කෙටිකාලීන ආයෝජන කිරීම් ප්‍රමාද කළනොහැකි බැවින් භාණ්ඩාගාර නිලධාරීන්ගේ උපදෙස් මත ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන අවස්ථාවේදීම භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලීම් ලිපි භාණ්ඩාගාරයට යොමුකර ඇති බව. | 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/ 214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය | (i) අධ්‍යයන කාර්යයන් සඳහා සහ සප්ත වාර්ෂික නිවාඩු මත විදේශගත වන විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ගුවන් ටිකට්පත් සහ අනෙකුත් පහසුකම් ලබාදීමට දේශීය අරමුදල් භාවිතා නොකල යුතු වුවද 2022 අප්‍රේල් 26 දින සිට 2023 මාර්තු 31 දින දක්වා සප්ත වාර්ෂික නිවාඩු මත විදේශගත වූ ආචාර්යවරුන් 04 දෙනෙකු හා කලත්‍රයෙක් සඳහා දේශීය අරමුදල්වලින් රු.435,500 ක්ද බැඳුම්කර හා ගිවිසුම් කඩවීම්වලින් ලැබුණු මුදලින් රු.1,466,300 ක්ද ගුවන් ටිකට්පත් හා උණුසුම් ඇඳුම් දීමනා සඳහා වැයකර තිබුණි. | සියළුම රාජ්‍ය ආයතන අමතා නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 2022/03දරන 2022 අප්‍රේල් මස 26 දිනැති චක්‍රලේඛය අනුව විශ්වවිද්‍යාලය විසින් සියළුම අනුමත කිරීම් අත් හිටවන ලදි .<br>ඉන් අනතුරුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපි අංක UGC/DA-F/Bond violation නොවැම්බර් 2022 මස 09 දිනැති ලිපිය මගින් අත් හිටුවන කාරණා සඳහා ඉඩදෙන ලද බව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | (ii) බැඳුම්කර හා ගිවිසුම් කඩවීම් හේතුවෙන් අයකරගන්නා මුදල් වෙනත් කාර්යයන් සඳහා යොදා නොගෙන ලද සැනින් රාජ්‍ය ආදායමට බැරකල යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු රු.19,007,654 ක් විශ්වවිද්‍යාලයේ ආදායම් ලෙසද ඊට පෙර වර්ෂවල ලැබුණු රු.133,497,387 ක් ස්ථාවර තැන්පතුවලද ආයෝජනය කර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 737 මඟින් සඳහන් කර ඇති විධිවිධාන අනුව විශ්වවිද්‍යාලය කටයුතු කර ඇති බව . | භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7.6 වගන්තිය | 1989 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලසීමාව තුළ බැඳුම්කර ගිවිසුම් කඩකරන ලද නිලධාරීන් 31 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.58,298,333 ක් 2022 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි. | නිලධාරීන් 06 දෙනෙකුට නඩු පවරා ඇත. එසේම ලිපිනය සොයාගැනීමට නොහැකි නිලධාරීන් 12 දෙනෙකු ද වාරික වශයෙන් අයකරන 07 දෙනෙකුද බැඳුම්කර කඩකර වසර දහය ඉක්මවා ඇති නිලධාරීන් හා අනෙක් නිලධාරීන් පිළිබඳව 2021 ඔක්තෝම්බර් 07 වැනි දින පැවති නිවාඩු කමිටුවේදී ගත් තීරණ අනුව ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | නිලධාරින්ගෙන් බැඳුම්කර කඩකිරීම හේතුවෙන් රජයට අයවිය යුතු මුදල් කඩිනමින් අයකර විශ්වවිද්‍යාල අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.14,415,469,928 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සහ පිරිවැය රු.12,744,012 ක් වූ අස්පෘශ්‍ය වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම්වලට වාර්ෂිකව එකතු වෙන ප්‍රමාණයන් හා ඒවායේ වටිනාකම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සටහන් මඟින් සෑම වසරකම විගණනයට ලබාදීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 වගන්තිය | එකතු කළ අගය මත බදු වැට් ඉන්වොයිසිය ලැබුණු පසුව සැපයුම්කරුට ගෙවිය යුතු වුවත්, වැට් ඉන්වොයිසි ලබාගැනීමකින් තොරව 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකතුව රු.10,088,143 ක් වූ වැට් බදු රඳවාගෙන තිබුණි. | රු.10,088,143ක රඳවාගෙන ඇති වැට් බදු මුදලට අදාළව අදාළ සැපයුම්කරුවන් විසින් වැට් බදු නිෂ්කාශන සහතිකය අපවෙත මෙතෙක් ඉදිරිපත් කර නැත. එබැවින් එම මුදල අදාල සහතිකය ඉදිරිපත් කරන තෙක් රඳවාගෙන ඇති බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (උ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ Operational Manual හි 2.3 වගන්තිය | පාඨමාලා මෙහෙයවීමේ ක්‍රියාකාරකම් කාලසටහන් (activity schedule) පිළිබඳව හා විශ්වවිද්‍යාලයේ සියළුම අංශවල ක්‍රියාකාරකම් ඇතුළත්ව 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබුණි. එහි කාර්යසාධන මට්ටම පරීක්ෂා කිරීමට 2020,2021 හා 2022 වර්ෂවල ක්‍රියාකාරී සැලැසුම්වල ප්‍රගතිය සකස්කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට ඉදිරියට නිවැරදිව පරිපාලන අංශ සඳහා අදාළ ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කර විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බව. | විශ්වවිද්‍යාලයේ සමස්ථ අරමුණු ඉටුකර ගැනිමට දායකවන සියළුම අංශවල ක්‍රියාකාරකම්ද සහිතව පිළියෙල කර ප්‍රගතිය සමාලෝචනය කරමින් විවෘත විශ්වවිද්‍යාලයේ කාර්යසාධනය ළඟා කර ගත යුතුය. |
| (ඌ) | 1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | විගණනයට ඉදිරිපත් කළ දත්ත අනුව විභාග 18 ක් පවත්වා මාස 03 ක් ඉක්ම වූ පසුව ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා අවමය දින 54 සිට උපරිමය දින 299 ක් දක්වා කාලයක් ගතවී තිබුණු අතර කණ්ඩායම් 88 ක විභාග පැවැත්වීම පිළිබඳ දත්ත විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.617,359,771 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.33,622,146 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.583,737,625 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ මූලධන හා පුනරාවර්තන ප්‍රදාන, පාඨමාලා ගාස්තු ආදායම හා අයදුම්පත් අලෙවි ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ගැලපීමට පෙර අතිරික්තය රු.542,960,584 ක් ද, මුළු ආදායම රු.4,516,515,077 ක් ද වුයෙන් ලාභදායී අනුපාතය සියයට 12 ක් විය. ඉකුත් වර්ෂයේ ලාභදායී අනුපාතය සියයට 2 ක් ලෙස පැවතුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 2:1 ක් හා 1:1 ක් වශයෙන් පැවතුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය ප්‍රකාරව නාමික ගාස්තුවක් අයකරමින් විශේෂ දීමනා පත්‍රයක් මඟින් හෙක්ටයාර් 8.2965 ක් වූ ඉඩම් 17 ක අයිතිය විවෘත විශ්වවිද්‍යාලය වෙත පවරාදීම වෙනුවෙන් 2021 ජුලි 19 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී තිබුණද විගණිත දිනය වූ 2023 මැයි 08 දින වනවිටත් එම ඉඩම් පවරාගැනීම් කටයුතු නිම කර නොතිබුණි. විවෘත විශ්වවිද්‍යාලය භුක්ති විඳින හෙක්ටයාර් 2.4506 ක් වූ ඉඩම් 05 ක අයිතියද පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් කැබලි 11 අයිතිය විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අවශ්‍ය නිර්දේශ අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ නිර්දේශ වාර්තාවන් පළාතේ ඉඩම් කොමසාරිස් මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින අතර පසුවිපරම් සිදුවන බව | අයිතිය පවරා ගැනිමේ කටයුතු කාර්යක්ෂමව ඉටුකළ යුතුය. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනම මත අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 41 දෙනෙකු සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 252 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.100,314,372 ක් දීමනා වශයෙන් ගෙවා තිබුණු අතර, තාවකාලික පදනම මත අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 21 දෙනෙකුද බඳවාගෙන දීමනා ගෙවා තිබුණි. | මෙම විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල අධ්‍යයනාංශවල සහ අනෙකුත් අංශවල පරිපාලන කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම සඳහා අනෙකුත් තනතුරු සඳහා පාලක සභාවේ අනුමැතිය සහිතව විශ්වවිද්‍යාලයේ උපයන මුදල්වලින් කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවාගෙන ඇත.<br>අනුමත කාර්යය මණ්ඩලයේ පවතින පුරප්පාඩුවල වෙන් කළ මුදල් භාවිතාකර (against Permanent Cadre Vacancies) අධ්‍යානාංශවල අධ්‍යයන කටයුතු ක්‍රමානුකූලව පවත්වාගෙන යාම සඳහා තාවකාලික කථිකාචාර්යවරුන් බඳවාගෙන ඇති බව. | අවශ්‍ය කරන අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිරිවැය රු.මිලියන 58 ක් වූ විශ්වවිද්‍යාලයේ අංශ 05 ක කටයුතු සම්බන්ධයෙන් මොඩියුල වශයෙන් ස්ථාපිත කර තිබුණු කළමනාකරණ තොරතුරු පද්ධතියේ (omis) පවතින අඩුපාඩු නිරාකරණය කරගැනීමට නඩත්තු සමාගම්වලට නොහැකි වී තිබුණි. එබැවින් 2018 වර්ෂයේ සිට නව අභ්‍යන්තර කළමනාකරණ තොරතුරු පද්ධතියක් (new omis) ස්ථාපිත කිරීම සඳහා රු.45,757,992 ක් වැය කර තිබුණද , සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් නව කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි . | 2018වසරේ සිට නව පරිගණක පද්ධතියක් ආරම්භ කිරීමට කටයුතු කලත් මේ වන විට පරිගණක පද්ධතිය නිර්මාණය සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීමේ කාර්යය පමණක් සිදුකර ඇති අතර , පරිගණක පද්ධතියක් ලෙස ගිණුම්ගත කිරීමට , පරිගණක පද්ධතියක් නිර්මාණය වී නොමැත. | විශ්වවිද්‍යාලය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර නිවැරදිව හා ඵලදායීව පවත්වා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ) | විවෘත විශ්වවිද්‍යාලයේ පීඨ 06ක් යටතේ අධ්‍යයන පාඨමාලා (Study Programmes) 226 ක් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ආරම්භ කළ යුතුව පැවතුණු නමුත්, අධ්‍යයන පාඨමාලා 90 ක් ආරම්භ කර නොතිබුණි. පීඨ 06 මඟින් ක්‍රියාත්මක කළ පාඨමාලා 136 ක අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම, අවසන් කිරීම, විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම යන ක්‍රියාකාරකම්වල ප්‍රමාදය මෙම කාලපරිච්ඡේදයේදී සාමාන්‍යය (Average) මාස 11 ක් ලෙස පැවතුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | සමස්ථ ක්‍රියාකාරකම් කාලසටහන (Activity Schedule) අනුව ප්‍රගතිය සමාලෝචනය කරමින් කාර්යසාධනය ළඟා කරගැනීමට කටයුතු කළ යුතුය |
| (ඇ) | 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසර 05ක කාලයක් තුළදී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය පවත්වන ප්‍රධාන පාඨමාලා 62 ක අයදුම්පත් කැඳවීම ආරම්භ කළ දින සිට ලියාපදිංචි කටයුතු අවසන් කිරීම දක්වා අවමය මාස 02 සිට උපරිමය මාස 20 කට වඩා වැඩි කාලයක් ගත වූ අවස්ථා 100 ක් විගණනයේදී නිරීක්ෂණය විය. මෙම අවස්ථා 100 න් අවස්ථා 30 ක් පමණක් Covid -19 රට තුළට පැතිරුණු කාලයට අයත්ව තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීමකින් පසු ප්‍රමාදයකින් තොරව ලියාපදිංචිය සිදුකර පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවෘත විශ්වවිද්‍යාලය විසින් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ක්‍රියාත්මක කරන | විශ්වවිද්‍යාලීය වෛද්‍ය රක්ෂණ ක්‍රමය පාලක සභා අනුමැතිය මත 2013 | රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා විධිමත් |

| | | |
|---|---|---|
| ලද සේවක රක්ෂණ ණය යෝජනා ක්‍රමය සඳහා 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා රජයේ මුදල් රු.42,192,534 ක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගෙවා තිබුණි. තවද, 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා රජයේ මුදල් රු.30,000,000 ක් හා සේවක දායකය රු.27,789,813 ක් විශ්වවිද්‍යාලය තුළ පිහිටුවන ලද ගෙවිය යුතු රක්ෂණ ගිණුමක් හරහා අභ්‍යන්තරව පත්කළ කමිටුවක නිර්දේශ මත සේවක රක්ෂණ ඉල්ලුම්පත්‍ර සඳහා රු.57,037,256 ක් වූ මුළු මුදලම ගෙවීමට කටයුතු කර තිබුණි. | වසරේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හරහා පවත්වාගෙන යන ලදී . නමුත් එහි යම් යම් අඩුපාඩු පැවති නිසා, උපකුලපතිතුමන් විසින් රක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳ අධ්‍යයන කරමින් හා අනෙකුත් විශ්වවිද්‍යාල තුළ පවතින මෙවන් වූ ස්වකීය වෛද්‍ය සුබසාධන යෝජනා ක්‍රම පිළිබඳ අධ්‍යයනයක් කර සැකසූ වාර්තාවක් සැලකිල්ලට ගනිමින් පාලක සභා අනුමැතිය ද ඇතිව 2020 වසරේ සිට විවෘත විශ්වවිද්‍යාලීය වෛද්‍ය සුබසාධන යෝජනා ක්‍රමය ආරම්භ කරන ලද බව. | අනුමැතිය ලබාගැනීමට කටයුතු කල යුතුය. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ වහලය හා තාපගතික විද්‍යාගාරයේ (thermodynamic lab) නවීකරණ කටයුතු ඍජු ශ්‍රම පදනම මත ඉටුකිරීමට 2022 අගෝස්තු ,සැප්තැම්බර් හා නොවැම්බර් මාසවල රු 11,272,916.ක අමුද්‍රව්‍ය මිලදීගෙන තිබුණු නමුත් මෙම නවීකරණයන් 2023 මැයි 15දින වනවිටත් ආරම්භ කර නොතිබුණි . | රත්නපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ වහලය නවීකරණ කටයුතු ශ්‍රී ලංකා යුධ හමුදාවේ ඍජු ශ්‍රම දායකත්වයෙන් සිදු කිරීමට සැලසුම් කර ඒ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය 2022 වසරේදී මිලදී ගන්නා ලදි . එම කටයුතු 2023 ජූනි මුල් සතියේ සිට ආරම්භ කිරීමට කටයුතු යොදා ඇති බව. | ව්‍යාපෘති හා ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයකින් තොරව ආරම්භ කර අරමුදල් ඌන උපයෝජනය වළකමින් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |